**රජයේ නිවේදන**

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් රාජ්‍යතාන්ත්‍රිකයකු හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධානයක් විසින් 100% ක් බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරනු ලැබූ හෝ දේශීයව මිලදී ගනු ලැබූ මෝටර් රථ විකිණීම හෝ අපහරණය මත ගෙවිය යුතු නිෂ්පාදන බද්ද නියම කිරීමේ ක්‍රමය මෙයින් නියම කරනු ලැබේ.

රාජ්‍යතාන්ත්‍රිකයකු හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධානයක් විසින් 100% ක් බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරනු ලැබූ හෝ දේශීයව මිලදී ගනු ලැබූ මෝටර් රථයක් විකිණීම හෝ අපහරණය මත ගෙවිය යුතු බදු ප්‍රමාණය, එම වාහනය ආනයනය කරනු ලබන අවස්ථාවේදී ගෙවිය යුතු නිෂ්පාදන බදු අනුපාතයෙන් ප්‍රතිශතයක් වනු ඇති අතර එම වාහනය පරිහරණය කරන ලද කාලය පදනම්ව පහත උපලේඛනයේ පරිදි නියම කරනු ලැබේ.

අදාළ වාහනයේ ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය හා අපහරණය හෝ විකිණීම සිදු කරනු ලබන දිනය අතර කාලය වාහනය භාවිතා කරනු ලැබූ කාල සීමාව වශයෙන් ගණනය කරනු ලැබේ. මෙම නියෝගය, 2015 නොවැම්බර් මස 21 දින හෝ එදිනට පසු ආනයනය කරනු ලැබූ හෝ දේශීයව මිලදී ගනු ලැබූ සහ රාජ්‍යතාන්ත්‍රිකයකුගේ හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධානයක නමින් ලියාපදිංචි කරන ලද එකී මෝටර් රථයක් විකිණීම හෝ අපහරණය මත බලපැවැත්විය යුතුය.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 මැයි මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

## උපලේඛනය

| **ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට රාජ්‍යතාන්ත්‍රිකයකු හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධානයක් විසින් භාවිතා කරනු ලැබූ කාලය** | **නිෂ්පාදන බදු අනුපාතය** |
|---|---|
| වසර 01කට අඩු | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 85% |
| වසර 01කට වැඩි හා වසර 02කට අඩු හෝ සමාන | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 75% |
| වසර 02කට වැඩි හා වසර 03කට අඩු හෝ සමාන | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 65% |
| වසර 03කට වැඩි හා වසර 04කට අඩු හෝ සමාන | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 55% |
| වසර 04කට වැඩි හා වසර 05කට අඩු හෝ සමාන | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 45% |
| වසර 05කට වැඩි හා වසර 06කට අඩු හෝ සමාන | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 35% |
| වසර 06කට වැඩි හා වසර 07කට අඩු හෝ සමාන | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 25% |
| වසර 07කට වැඩි හා වසර 08කට අඩු හෝ සමාන | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 15% |
| වසර 08කට වැඩි | ගෙවිය යුතු නිෂ්පාදන බද්දෙන් 10% |